

# නත්තල යනු ?

අශාන් කුමාරගේ

තවත් නත්තලක් අත ලඟටම පැමිණ ඇත. ඒ සමගම නත්තල් සීයාද කරළියට පැමිණ ඇත. වර්ථමානයේ නත්තල යනු කුමක්දැයි කුඩා දරුවෙකුගෙන් ඇසූ විට එය නත්තල් සීයාගේ උපන්දිනය යැයි පිළිතුරු දුනහොත් එහි කිසිඳු වරදක් මම නොදකිමි. ඒ තරමටම නත්තල අද වාණිජීකරණය වී ඇත. ව්‍යාපාරිකයන් නත්තල අද තමන්ගේ ප්‍රධාන වෙළඳ උපක්‍රමයක් කොටගෙන ඇත. නත්තලට මාස ගණනකට පෙර සිටම නත්තල ඉලක්ක කොට වෙළඳ ප්‍රචාර කිරීමටත්, ඒ සඳහා නත්තල් සීයා ප්‍රධාන භූමිකාවට ගෙන ඒමටත් ව්‍යාපාරිකයන් පෙළඹී ඇත. නත්තල කියූ පමණින් අපට නත්තල් සීයා සිහිවන්නේ ඒ නිසාය.

නමුත් නියම නත්තලේ අරුත අපේ දරුවන්ට වටහා දීම අපේ යුතුකමකැයි මම සිතමි. නත්තල් සමයේ තමන්ට ලැබෙන තෑගි බෝග ගැන සිහින මවමින් සිටින දරුවන්ට මෙන්ම ඇතැම් වැඩිහිටියන්ටද එදා පළමු නත්තලේදී අපට ලැබුණා වූ උතුම් තෑග්ග සිහිපත් කර දීම ඉතා වැදගත්ය. එදා දෙවියන් වහන්සේ තම ඒකජාතක පුත්‍රයානන් මිනිසුන් වෙනුවෙන් දුක් විඳීමට මෙලොවට තෑග කළ බව අප අමතක නොකළ යුතුය. එවැනි උතුම් වූ ත්‍යාගයක් ගැන සිතීමටවත් අපට පුලුවන්කමක් නැති නමුත්, දෙවියන් වහන්සේ ඒ පරිත්‍යාගය තුලින් බලාපොරොත්තු වූ එකිනෙකාට ප්‍රේම කිරීම, අන් අයට සමාව දීම, සහ හැම අයෙකුටම ආදරයෙන් සැලකීම වැනි උතුම් ත්‍යාගයන් මිනිසුන් අතර බෙදා දීමට අපට හැකියාව ඇත. දෙවියන් වහන්සේගේ එවන් වූ උදාර ත්‍යාගය තුලින් අපට ලැබුනු නත්තල් සමයේ අපට මිනිසුන් වෙනුවෙන් යමක් කළ හැකි නම්, එය වෛවාරන තෑගි සඳහා මුදල් වැය කරනවාට වඩා නත්තල අර්තවත් කරන්නක් වනු ඇත.

එදා ඒ පළමු නත්තලේ දී දෙවියන් වහන්සේ තම පුතුන් මෙලොවට එවන ලද්දේ අහිංසක අසරණ මිනිසුන් වෙනුවෙන් හඬක් නැඟීමටය. ජේසුතුමන් මහා මැඳුරකට නොව දුප්පත් ගව මඩුවක උපත ලැබුවේ ඒ නිසාය. එසේ අසරණ අහිංසක දරුවෙකු ලෙස සාමන්‍ය මිනිසුන් අතර එදා ජේසු තුවන් උපත ලැබුවේ ඒ තුළින් අහිංසක දුප්පත් මිනිසුන්ට යම්කිසි බලාපොරොත්තුවක් ලබා දීමටය. නමුත් වසර දෙදහසකට පමණ පසුවත් නත්තල යනු දුප්පත් මිනිසුන්ගේ බලාපොරොත්තුවක් පමණක් වී ඇත.

අද නෑදෑ මිත මිතුරන් පිරිවරා නත්තල් සාද පැවැත්වීම තවත් සම්ප්‍රදායක් වී ඇත. එහි කිසිදු වරදක් නැතත් ඒ සාද සඳහා දහස් ගණන් මුදල් විසිකරන්නාවූ අපට කුස ගින්නට වතුර බිඳක්වත් නොමැතිව මිය යන දහස් ගණන් අහිංසක දූ දරුවන් අප අතර සිටින බව අමතක වී ඇත. එදා පළමු නත්තල් සාදයට දෙවියන් වහන්සේ මුලින්ම ආරාධනා කළේ අසරණ දුප්පත් එඬේරුන්ටය. ඒ ජේසුතුමන් අසරණයින්ගේ රජු ලෙස මෙලොව එළිය දුටු නිසාය. නමුත් අද අපේ නත්තල් සාදයට හෝ නත්තල් කෑම මේසයට දුප්පතුන්ට ආරාධනා ලැබෙන්නේ නැත. අඩුම තරමින් දුප්පත් මිතුරෙකුට හෝ ආරාධනා කරන්නේ කලාතුරකිනි. ප්‍රථම නත්තලේදී දෙවියන් වහන්සේ අපට දුන් පණිවිඩය ඒ තරමටම අපට අමතක වී ඇත.

පළමු නත්තලෙන් වසර දෙදහස් ගණනකට පසු නත්තලේ නියම වටිනාකම අපට අමතක වීම අරුමයක් නොවේ. විශේෂයෙන් සෑම දෙයක්ම මුදලින් තක්සේරු කරන මෙවන් කාලයක දෙවියන් වහන්සේගේ පණිවුඩය සහ උන් වහන්සේගේ ත්‍යාගය විහිලුවක් ලෙස දකින්නන්ද අප අතර සිටිති. කෙසේ වෙතත් නත්තල යනු අසරණ අහිංසක මිනිසුන් වෙනුවෙන් යමක් කළ යුතු, ලෝකයට සාමය සමාදානය සහ ආදරය තෑගි කළ යුතු අර්තවත් සාදයකි.

ඉතින් මේ නත්තලේ සිට හෝ නත්තල් සේල්වලම හෝ මත්පැන් පිරුණු සාද වලට නිකරුනේ විසි කරනා මුදලින් කොටසක් හෝ අසරණ දුප්පත් අයකු වෙනුවෙන් පරිත්‍යාග කළ හැකිනම්, නොයෙකුත් බේද බින්න ඉවතලා අසල් වැසියාට ප්‍රේම කළ හැකිනම්, තරාතිරම හෝ ජාතිය නොබලා අසරණයෙකුට පිහිට වන යහපත් සමාර්ථයෙකු විය හැකි නම් එදා ඒ ප්‍රථම නත්තලේදී අපට දෙවියන් වහන්සේ දුන් තෑග්ගට නියම වටිනාකමක් දිය හැකි වනු ඇත. ඒ තුලින් ජේසු තුමන්ගේ නියම උපන්දින සාදයට අපටද සහභාගි විය හැකිවනු ඇත. දෙවියන් වහන්සේගේ උතුම් වූ නත්තල් බලාපොරොත්තුවද එය වනු නිසැකය.

LANKAN AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886
9798 2200
14/30 Tower Court
Noble Park 3174

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)